# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,130 — 1960 මැයි 13 වැනි සිකුරාද — 13.5.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස – පළාත් පාලනය

(මෙහි වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 93 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මැගී කොම්පි දැන්වීම ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 93 |


## නිවේදන

L.G.D.—A. 636

### 1947 තේ අංක 29 දරණ නාගරික සභා ආඥාපණත

1947 තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත, 1947 තේ අංක 29 දරණ නාගරික සභා ආඥාපණතේ 9 වැනි වගන්තිය යටතේ පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදිත නියෝගයයි.

ජේ. ආර්. ජයවර්ධන,<br>
පළාත් පාලන සහ නිවාස කටයුතු<br>
පිළිබඳ ඇමතිවරයා.

1960 මැයි මස 3 දින,<br>
කොළඹ, පළාත් පාලන කායසීලයේ දීය.

**නියෝගය**

1947 තේ අංක 29 දරණ නාගරික සභා ආඥාපණත යටතේ සංස්ථාපනය කිරීමට අදහස් කොට තිබෙන දෙහිවල-ගල්කිස්ස නාගරික සභාවේ නිලකාලය ආරම්භ වියයුතු දිනය වශයෙන්, 1961 කේ පෙබරවාරි මස 1 වැනිදා දිනය මෙයින් නියම කර සිටිනු ලැබේ.

---

## විවිධ දැන්වීම්

### පිස්සු බලු රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර (333 වැනි පරිච්ඡේදය) වැලිමඩ සුළුනගර සභාවේ පාලන සීමා ඇතුලත පිහිටි කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක්, විදුහලක්, ගෙවත්තක් නොවන කිසියම් ස්ථානයක සිටින නොබඳින ලද හෝ දක්කාගෙන නොයන ලද කිසියම් බල්ලකු මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලය ලත් කිසියම් පුද්ගලයකු විසින් එවේලෙහිම විනාශ කර දමනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1960 දෙසැම්බර් මස 31 වැනිදින දක්වා වලංගු වන්නේ ය.

ඞී. පී. පෙරේරා,<br>
වැලිමඩ සුළුනගර සභාවේ සභාපතිතැන.

1960 මැයි මස 4 වැනි දින;<br>
වැලිමඩ සුළුනගර සභා කායසීලයේ දීය.

---


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

93—ජේ. ඇන්. බී 23689—3,299 (5/60)

F 1